# 6. මිල සහ වැටුප්

## 6.1 මිල

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල ගණන්වල වෙනස්වීම් මැනීම සඳහා දර්ශක හතරක් තිබේ. ඒවානම්, කොළඹ නගරයේ වැඩ කරන පංතියෙහි 1949/50 වර්ෂයේ පාරිභෝජන භාණ්ඩ පැස මත පදනම් වූ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද), මහ කොළඹ ප්‍රදේශයේ පහළම ආදායම් ඉපැයූ සියයට 40 ක පාරිභෝගිකයන්ගේ 1985/86 පාරිභෝජන භාණ්ඩ පැස මත පදනම් වූ මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.), 1974 බර තැබීම් මත පදනම් වූ තොග අලෙවි මිල දර්ශකය (තො.අ.මි.ද.) හා වර්තමාන මිල ගණන් අනුව ගණනය කළ දළ ජාතික නිෂ්පාදනය, ස්ථාවර මිල ගණන් අනුව ගණනය කළ දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගණනය කරනු ලබන ගම්‍ය මිල දර්ශකයයි. මුලින් සඳහන් කළ දර්ශක තුන සමස්ථ මිල ගණන් පෙන්නුම් කරන දර්ශකයන් ලෙස සැළකීමේදී, ඒවායෙහි සීමාකාරිත්වයන් හා දුර්වලතාවයන් ඇත. සමස්ථ මිල මට්ටම වෙනස්වීම මැනීමට වඩාත්ම යෝග්‍ය දර්ශකය දළ ජාතික නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකයයි (ද.ජා.නි.ග.මි.ද.). කෙසේ වුවද, දළ ජාතික නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය ලබා ගතහැකි වන්නේ වර්ෂයකට වරක් පමණි. ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීම සඳහා පුළුල් දර්ශකයක් වශයෙන් පෞද්ගලික අංශය, වෘත්තිය සංගම් හා රජය විසින් සියළුම ප්‍රායෝගික හා ප්‍රතිපත්ති සැකසීමේදී යොදාගනු ලබන්නේ, කොළඹ පාරිභෝගියන්ගේ මිල දර්ශකයයි.

**සංඛ්‍යා සටහන 6.1**

**වාර්ෂික සාමාන්‍ය මිල වෙනස්වීම (%)**

| | කො.පා.මි.ද. | ම.කො.පා.මි.ද. | තො.අ.මි.ද | ද.ජා.නි.ග. මි.ද. |
|---|---|---|---|---|
| 1980 | 26.1 | - | 33.7 | 18.2 |
| 1981 | 18.0 | - | 17.0 | 20.6 |
| 1982 | 10.8 | - | 5.5 | 10.2 |
| 1983 | 14.0 | - | 25.0 | 14.7 |
| 1984 | 16.6 | - | 25.6 | 17.4 |
| 1985 | 1.5 | - | -15.2 | 0.8 |
| 1986 | 8.0 | - | -2.9 | 5.5 |
| 1987 | 7.7 | - | 13.4 | 6.8 |
| 1988 | 14.0 | - | 17.8 | 11.5 |
| 1989 | 11.6 | - | 9.0 | 9.7 |
| 1990 | 21.5 | 24.6 | 22.2 | 20.0 |
| 1991 | 12.2 | 11.5 | 9.2 | 11.2 |
| 1992 | 11.4 | 9.4 | 8.8 | 10.0 |
| 1993 | 11.7 | 8.4 | 7.6 | 9.5 |
| 1994 | 8.4 | 4.8 | 5.0 | 9.4 |
| 1995 | 7.7 | 3.9 | 8.9 | 8.3 |
| 1980-1984[1] | 16.4 | - | 18.2 | 15.8 |
| 1985-1989[1] | 6.8 | - | 9.9 | 5.1 |
| 1990-1994[1] | 12.4 | 10.1 | 9.2 | 11.5 |

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

[1]ප්‍රතිශත වෙනස්වීම් ගුණෝත්තර සාමාන්‍ය ලෙස දී ඇත.

පසුගිය වර්ෂ 16 ක කාලය සළකා බලන විට, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ ගණනය කිරීමට අනුව, 1980 -84 කාලය තුළ අංක දෙකක උද්ධමන වේගයක් වාර්තා වී ඇති අතර 1985 - 87 කාලය තුළ උද්ධමන වේගය තනි අංකයක මට්ටමකට පහත වැටීමක් පෙන්වයි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට අනුව උද්ධමනය ගණනය කිරීමේදී, 1988 - 1993 පස් අවුරුදු කාලය සඳහා වූ වාර්ෂික උද්ධමන වේගයේ සාමාන්‍යය සියයට 13.6 ක් වෙමින්, 1988 සිට නැවතත් නොකඩවා අංක දෙකක මට්ටමක උද්ධමනය පැවතීම හිතකර නොවන තත්ත්වයකි. 1994 දී උද්ධමනය සියයට 8.4 දක්වා සැලකිය යුතු ලෙස අඩු වූ අතර, 1995 දි සියයට 7.7 දක්වා තවදුරටත් පහත වැටුණි. 1990 දී වාර්තා වූ ඉහළම උද්ධමන වේගය වූ සියයට 21.5 සිට පසුගිය වසර 5 තුළ උද්ධමන වේගය පහත වැටී තිබීම සැලකිය යුතු කරුණක් වූ අතර, 1987 ට පසුව, 1995 වර්ෂයේදී පිළිවෙලින් දෙවන වසරටත් තනි අංකයක උද්ධමන වේගයක් වාර්තා කරන ලදී. මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය හා දළ ජාතික නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය මගින් ද 1995 වර්ෂය තුළ උද්ධමන වේගයේ සැළකිය යුතු අඩුවීමක් වාර්තා වී ඇත.

1995 දී උද්ධමනය අඩු මට්ටමක පැවතීමට, මූලික ද්‍රව්‍යවල පාලන මිල ගණන් අඩු කිරීම් මෙන්ම, මධ්‍යස්ථ ආර්ථික වර්ධන අනුපාතිකයක් හේතුකොට ගෙන වෙළෙඳපොළේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල සැපයුම් වැඩිවීමත් සැළකිය යුතු ලෙස බලපෑවේය. ප්‍රතිපත්ති ප්‍රකාශන කිහිපයකම සඳහන් වූ මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා වූ රජයේ දැඩි කැපවීම අනුව කටයුතු කිරීමක් වශයෙන්, මිලෙහි කාලීන උච්චාවචන අඩු කරලීම සඳහා රාජ්‍ය අංශයේ වෙළඳ සංවිධාන මගින් ගතික වෙළෙඳ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමත් මෙන්ම ඉහළ තීරුබදු ආරක්ෂණ අඩුකිරීමත් 1995 උද්ධමන වේගය අඩුවීමට හේතු විය. කෙසේ වුවද, වර්ෂයේ පසු භාගයේදී උද්ධමන වේගය ඉහළයෑමේ උපනතියක් ඇතිවිය. තිරිඟු පිටි මිල සඳහා වූ සහනාධාර ක්‍රමයේ බලපෑම ක්‍රමයෙන් අඩුවීයාම, විනිමය අනුපාතිකය සීග්‍ර ලෙස අවප්‍රමාණවීම සහ මූල්‍ය ප්‍රසාරණයේ වේගය වැඩිවීම යන කරුණු සියල්ල 1995 සිව්වන කාර්තුව තුළදී සාමාන්‍ය උද්ධමන වේගයේ ඉහළ යාමේ උපනතියට හේතු විය. එමෙන්ම 1994 දෙසැම්බර් සිට 1995 දෙසැම්බර් දක්වා වූ වාර්ෂික පදනම යටතේ, පාරිභෝගික මිල දර්ශක දෙක අනුව උද්ධමන වේගය ගණනය කළ විට, 1994 වර්ෂයේදී එහි පහත වැටීමක් සිදුවුවද 1995 දී නැවත වැඩි වීමක් වාර්තා විය.

ප්‍රාථමික වෙළඳපොල මට්ටමේ මිල ගණන් අනුව ගණනය කරනු ලබන තොග අලෙවි මිල දර්ශකය, වැඩිවීමේ වේගය 1994 සියයට 5.0 සිට 1995 දී සියයට 8.9 දක්වා වැඩිවිය. වර්ෂය තුළ ප්‍රධාන ආනයන හා අපනය මිල ඉහළයෑම් කෙරෙහි මෙම මිල දර්ශකය වැඩි සංවේදීතාවයක් දක්වන බව මෙයින් පිළිබිඹු වේ. පාරිභෝගික මිල දර්ශක මෙන්ම, 1994 වර්ෂයේදී අඩුවීමක් වාර්තා කරන ලද තොග අලෙවි මිල දර්ශකයේ ලක්ෂ්‍යමය පදනම මත වූ ප්‍රතිශත වෙනස 1995 අගදී සියයට 17 කින් වැඩිවිය.

1994 පසු භාගයේදී තිරිඟු පිටි, පාන් සහ භූමිතෙල් මිල අඩු කිරීම්, 1995 සමස්ථ උද්ධමන මට්ටම කෙරෙහි තරමක් දුරට බලපෑමක් ඇති කෙරුණි. මෙම අයිතම තුනේ මිල ගණන් 1994 මැද භාගයේදී නොවෙනස්ව පැවතුණි නම් 1995 දී කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වැඩිවීමේ වේගය සියයට 9.9 ක තරම් ඉහළ අගයක් වීමට ඉඩ තිබුණි. යහපත් කාලගුණික තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වී, පොල්

සංඛ්‍යා සටහන 6.2

## කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (1952 = 100)

| ශීර්ෂය | හරිත | දර්ශකයේ සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යාමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1994 | 1995 | 1994 | 1995 | දෙසැ. 1994 | දෙසැ. 1995 |
| සියළු ශීර්ෂ | 100.0 | 1527.4 | 1644.6 | 8.4 | 7.7 | 4.2 | 11.5 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර | 61.9 | 1654.1 | 1768.1 | 8.9 | 6.9 | 3.6 | 11.2 |
| රෙදිපිළි | 9.4 | 795.7 | 803.9 | 1.7 | 1.0 | 0.2 | 1.4 |
| ඉන්ධන හා ආලෝකය | 4.3 | 3131.6 | 3322.4 | 14.7 | 6.1 | 1.0 | 12.9 |
| ගෙවල් | 5.7 | 109.8 | 109.8 | - | - | - | - |
| විවිධ | 18.7 | 1578.7 | 1800.6 | 5.9 | 14.1 | 9.7 | 15.6 |

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සහ එළවු වැනි සමහර ප්‍රධාන කෘෂි භෝගවල සැපයුම වැඩිවීම සහ වෙළෙඳපොලේ හිඟයක් ඇතිවූ කාලපරිච්ඡේද තුළ ප්‍රධාන ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම ද වර්ෂය තුල මිල ගණන්වල ඉහළයාම් සීමා කිරීම සඳහා දායක වූ අනෙකුත් සාධක විය. මෙම හේතූන් නිසා වර්ෂය අගදී සාමාන්‍යයෙන් දැකිය හැකි මිල ගණන් ඉහළ යෑම්, 1995 වර්ෂය තුලදී විද්‍යාමාන නොවිය.

### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය


වර්ෂය තුළ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ හැසිරීම තරමක් දුරට කාලීන ලක්ෂණ පිළිබිඹු කෙරුණි. නිෂ්පාදනයේ කාලීන රටාවන් පෙන්නුම් කරමින් 1995 පෙබරවාරි සිට මාර්තු (මහ අස්වනු කාලය) දක්වා කාලය තුළ හා නැවත අගෝස්තු සිට සැප්තැම්බර් (යල් අස්වනු කාලය) දක්වා කාලය තුළ මිල දර්ශකය පහත වැටී ඇත. පසුගිය වර්ෂයේදී පාලන මිල අඩුකිරීම් තුළින් වූ බලපෑම ක්‍රමිකව අඩුවී යෑම හා තිරිඟු පිටි සඳහා වූ සහනාධාරයෙන් කොටසක් ඉවත් කිරීම හේතුකොට ගෙන, 1995 සැප්තැම්බර් මාසයෙන් පසුව මිල ගණන් ඉහළ යෑමේ වේගය වැඩිවිය.

මිල දර්ශකයේ වඩා වැදගත් කාණ්ඩය වූ ආහාර කාණ්ඩයෙහි, සාමාන්‍ය වාර්ෂික වැඩිවීම 1995 වර්ෂයේදී සියයට 6.9 ක් වූ අතර, පෙර වර්ෂයේ මෙම වැඩිවීම සියයට 8.9 ක් විය. 1994 වර්ෂයේ දෙවැනි භාගයේදී තිබුණු ලෙස අඩු කරනු ලැබූ තිරිඟු පිටි සහ පාන් මිල, සැප්තැම්බර් පසු භාගය දක්වා නොවෙනස්ව පැවතුණි. ඉන්පසු කිලෝ ග්‍රෑමය රු. 7.95 ක් වූ තිරිඟු පිටි සහ රු. 3.50 ක් වූ ග්‍රෑම් 450 ක පාන් ගෙඩියක මිල, 1995 සැප්තැම්බර් සිට නොවැම්බර් කාලය තුළදී පිළිවෙලින් රු. 11.95 සහ රු. 5.00 දක්වා ඉහළ නැන්වෙන පරිද්දෙන් අවස්ථා කිහිපයකදී ප්‍රතිසංශෝධනය කරනු ලැබිය. 1995 වර්ෂයේ සැහෙන කාලයක් තුළ තිරිඟු පිටි සහ පාන් සඳහා අඩු මිලක් පැවතීම, සහල් මිල වැඩිවීම මැඩ පැවැත්වීම කෙරෙහි සැළකිය යුතු ලෙස බලපෑවේය. මේ හා සමග වාර්තාගත ඉහළ වී අස්වැන්න ද වර්ෂය තුළ සහල් මිල පහත මට්ටමක තිබීමට තවදුරටත් උපකාරි විය. පෙර වර්ෂය සමග සසඳන විට 1995 වර්ෂයේදී පොල්, අර්තාපල් සහ එළවු වැනි අනෙකුත් ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ද පහත වැටුණි. පොල් හා එළවු නිෂ්පාදනය ඉහළ යාම හේතුකොට ගෙන සැපයුම වැඩිවීම ඒවායේ මිල ගණන් පහත වැටීමට හේතුවිය. අර්තාපල් මිල පහත වැටීමට හේතු වූයේ වෙළඳපොලෙන් ආනයනික අර්තාපල් ලබාගැනීමට හැකි වීමයි. 1995 වර්ෂය ආරම්භයේදී සැපයුම ඉහළ යාම හේතුකොට ගෙන මාළු මිල තිබුණු ලෙස පහත වැටුණ අතර, ඊට පසු උතුරු-නැගෙනහිර ප්‍රදේශවල එදිරිවාදිකම් නැවත ආරම්භවීමෙන් ධීවර කටයුතු අඩාල වීම සහ හැඹිලි දැල් මගින් එළිය අල්ලා මාළු ඇල්ලීම තහනම් කිරීම හේතුකොට ගෙන සැළකිය යුතු ලෙස මිල වැඩිවුණි. බොහෝ වර්ගවල එලවළු, මස් හා මුංඇට වලද මිල සැළකිය යුතු ලෙස වර්ෂය තුලදී වැඩිවිය.

ඉන්ධන හා අලෝකය කාණ්ඩයේ මිල ගණන් 1994 වර්ෂයේදී වූ සියයට 14.7 කින් වැඩිවීම හා සසඳන විට 1995 වර්ෂයේදී සියයට 6.1 කින් වැඩිවිය. 1994 වර්ෂයේ පසු භාගයේදී අඩුකරනු ලැබූ භූමිතෙල් මිල, 1995 වර්ෂය තුලද නොවෙනස්ව පැවතීම නිසා මෙම කාණ්ඩයේ මිල ගණන් කෙරෙහි සහනදායි බලපෑමක් ඇති කෙරුණි. විදුලිබල ගාස්තු ද වර්ෂය තුළ නොවෙනස්ව පැවතුණි. ඉන්ධන හා ආලෝකය කාණ්ඩයේ මිල ගණන් ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන සාධකය වූයේ දර මිල ඉහළ යාමයි.

දේශීය වෙළඳපොළේ සැපයුම් තත්ත්වය සතුටුදායක වීම හේතුකොට ගෙන 1994 වර්ෂයේදී මෙන් විමසුමට ලක්කරන වර්ෂය තුළ රෙදිපිළි කාණ්ඩයේ මිල ගණන් ද සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. කෙසේවුවද, විවිධ කාණ්ඩයේ මිල

රූප සටහන 6.1
කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය
(1952 = 100)



ගණන් වර්ෂය තුළදී සියයට 14.1 කින් තියුණු ලෙස වැඩිවිය. බුලත් සහ පුවක්, පුවත්පත් සහ ලොන්ඩරි ගාස්තු ඉහළ යාම, විවිධ කාණ්ඩයේ මිල ගණන් දැඩි ලෙස වැඩිවීම සඳහා දායක වූ ප්‍රධාන සාධක විය.

## මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 1989 වර්ෂයේ සිට ගණනය කරනු ලබන, මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.) විකල්ප පාරිභෝගික මිල දර්ශකයකි. මෙම දර්ශකයෙන් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට වඩා පුළුල් වූ භාණ්ඩ ප්‍රමාණයක් හා භූගෝලීය ප්‍රදේශයක් ආවරණය වේ. පෙර වර්ෂයේදී මෙන් 1995 වර්ෂයේදී ද, මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය කොළඹ පාරිභෝගිකයන්ගේ

පෙර වර්ෂයේදී සියයට 8.2 ක තරම් අඩු මට්ටමක මිල ඉහළ යාමක් වාර්තා වී තිබූ මත්පැන්, දුම්කොළ, බුලත් සහ පුවක් කාණ්ඩයේ මිල ගණන් 1995 වර්ෂයේදී සියයට 17.3 කින් වැඩිවිය. රෙදිපිළි හා පාවහන්, සනීපාරක්ෂක හා සෞඛ්‍ය සේවා, ගෘහස්ථ භාණ්ඩ හා සේවා සහ ගමනාගමන හා පණිවිඩ හුවමාරු යන කාණ්ඩවල මිල ගණන් 1994 වර්ෂය සමඟ සසඳන විට 1995 වර්ෂයේදී වේගවත්ව වැඩි වී ඇත. මීට ප්‍රතිවිරුද්ධව, ඉන්ධන හා ආලෝකය සහ විවිධ යන කාණ්ඩවල මිල ගණන්, 1995 වර්ෂයේදී අඩු මට්ටමක ඉහළ යෑමක් වාර්තා කෙරුණි.

## තොග අලෙවි මිල දර්ශකය

තොග අලෙවි මිල දර්ශකය (තො.අ.මි.ද.) මගින් ප්‍රාථමික වෙළඳපොළ මට්ටමේ මිල වෙනස්වීම් ගණනය කරනු

සංඛ්‍යා සටහන 6.3

**මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(ජනවාරි සිට ජූනි දක්වා 1989 = 100)**

| ශීර්ෂය | භරිත | දර්ශකයේ සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1994 | 1995 | 1994 | 1995 | දෙසැ. 1994 | දෙසැ. 1995 |
| සියළුම ශීර්ෂ | 100.0 | 172.6 | 179.3 | 4.8 | 3.9 | 1.4 | 7.5 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාරපාන | 69.3 | 179.1 | 183.2 | 4.0 | 2.3 | - | 6.6 |
| මත්පැන්, දුම්කොළ, බුලත් සහ පුවක් | 3.8 | 194.9 | 228.7 | 8.2 | 17.3 | 9.9 | 20.8 |
| ගෙවල් කුලී | 8.9 | 109.5 | 109.7 | 0.2 | 0.1 | 0.2 | 0.2 |
| ඉන්ධන හා එළිය | 5.4 | 184.8 | 200.5 | 17.0 | 8.5 | 6.2 | 13.1 |
| රෙදිපිළි සහ පාවහන් | 2.8 | 197.8 | 210.5 | 3.9 | 6.4 | 5.6 | 4.2 |
| සනීපාරක්ෂක, සෞඛ්‍ය සේවා, ගෘහස්ථ භාණ්ඩ හා සේවා | 4.9 | 165.3 | 182.7 | 6.7 | 10.5 | 5.0 | 16.5 |
| ගමනාගමන සහ විදුලිපණිවිඩ | 2.8 | 164.3 | 167.6 | 0.5 | 2.0 | - | 2.3 |
| විවිධ | 2.1 | 149.9 | 162.9 | 11.6 | 8.7 | 16.0 | 5.0 |


මූලය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිල දර්ශකයට වඩා මිල ඉහළයෑමේ සැළකිය යුතු අඩු වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙයට හේතු වූයේ දර්ශක දෙකෙහි බර තැබීම්වල සංයුතියෙහි ඇති වෙනස්කම්ය. ම.කො.පා.මි.ද. මගින් 1995 වර්ෂය සඳහා වාර්තා වී ඇත්තේ සියයට 3.9 ක වැඩිවීමක් පමණක් වන අතර, එහි 1994 වර්ෂයේදී වූ වැඩිවීම සියයට 4.8 කි.

ම.කො.පා.මි. දර්ශකයට අනුව 1995 වර්ෂයේදී ආහාර මිල ගණන් සියයට 2.3 කින් වැඩිවී ඇති අතර, කො.පා.මි. දර්ශකයට අනුව වාර්තා වී ඇති ආහාර මිල ගණන් වැඩිවීම සියයට 6.9 කි. ධාන්‍ය වර්ග සඳහා කො.පා.මි. දර්ශකයට වඩා සාපේක්ෂව ඉහළ බරතැබීමක් ම.කො.පා.මි. දර්ශකයේ දක්නට ඇති අතර, කො.පා.මි. දර්ශකයේ, 1995 වර්ෂය තුළදී තියුණු ලෙස මිල වැඩිවූ, එළවළු සහ මාළු වැනි භාණ්ඩ සඳහා ඉහළ බරතැබීමක් ඇත. වර්ෂය තුළදී දර්ශක දෙකෙන් දැක්වූ වෙනස් වූ අනුපාතිකයන්ගෙන් මිල ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, මෙම බරතැබීම් වල වෙනස්කම්ය. කෙසේවුවද, මෙම දර්ශක දෙකෙන්ම පෙන්නුම් කළ මිල වෙනස්වීමේ උපනතීන් එකම දිශාවකට යොමුවිය.

ලබයි. තේ, රබර්, පොල් වැනි ප්‍රධාන මූලික අපනයන භාණ්ඩ වලට දර්ශකයේ සැළකිය යුතු බරතැබීමක් තිබෙන නිසා, මෙම දර්ශකයේ වෙනස්වීම් වලට ඒවායේ මිල වෙනස්වීම් විශාල

රූප සටහන 6.2
මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය
(ජන.. සිට ජූනි 1989 = 100)



### සංඛ්‍යා සටහන 6.4

## තෝරාගත් ආහාර ද්‍රව්‍යවල සිල්ලර විකුණුම් මිල ගණන් (මුළු දිවයින)

| අයිතමය | ඒකකය | මිල රුපියල්වලින් 1993 | මිල රුපියල්වලින් 1994 | මිල රුපියල්වලින් 1995 | ප්‍රතිශත වෙනස 1994 | ප්‍රතිශත වෙනස 1995 |
|---|---|---|---|---|---|---|
| සහල් (තම්බන ලද වර්ගය) | රු/කි.ගෑ. | 16.48 | 15.85 | 16.11 | -3.8 | 1.6 |
| පාන්, ග්‍රෑම් 450 | රු./ගෙඩියක් | 4.83 | 4.66 | 3.81 | -3.5 | -18.2 |
| බිත්තර, සාමාන්‍ය | රු/බිත්තර | 2.74 | 2.95 | 3.28 | 7.7 | 11.2 |
| පොල්, මධ්‍යම ප්‍රමාණය | රු/ගෙඩියක් | 7.29 | 6.04 | 5.45 | -17.1 | -9.8 |
| එළවළු | | | | | | |
| කරවිල | රු/කි.ග්‍රෑ. | 19.70 | 24.91 | 26.70 | 26.4 | 7.2 |
| ගෝවා | රු/කි.ග්‍රෑ. | 17.63 | 21.68 | 24.87 | 23.0 | 14.7 |
| කැරට් | රු/කි.ග්‍රෑ. | 23.88 | 30.93 | 33.60 | 29.5 | 8.6 |
| බෝංචි | රු/කි.ග්‍රෑ. | 22.75 | 28.97 | 30.01 | 27.3 | 3.6 |
| ලීක්ස් | රු/කි.ග්‍රෑ. | 24.53 | 30.49 | 33.44 | 24.3 | 9.7 |
| අර්තාපල් | රු/කි.ග්‍රෑ. | 44.64 | 52.04 | 47.57 | 16.6 | -8.6 |
| රතුළූණු | රු/කි.ග්‍රෑ. | 37.90 | 49.61 | 40.34 | 30.9 | -18.7 |
| වියළි මිරිස් (තො.1) | රු/කි.ග්‍රෑ. | 119.99 | 110.61 | 122.28 | -7.8 | 10.6 |
| මුහුදු මාළු | | | | | | |
| කෙලවල්ලා | රු/කි.ග්‍රෑ. | 107.40 | 112.25 | 128.69 | 4.5 | 14.6 |
| ගල්මාලු | රු/කි.ග්‍රෑ. | 75.66 | 86.66 | 92.87 | 14.5 | 7.2 |
| හුරුල්ලා | රු/කි.ග්‍රෑ. | 64.44 | 68.97 | 72.63 | 7.0 | 5.3 |
| සාලයා | රු/කි.ග්‍රෑ. | 48.55 | 50.00 | 53.59 | 3.0 | 7.2 |

මූලය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

බලපෑමක් ඇති කරනු ලබයි. තො.ළ.මි. දර්ශකයෙහි 1994 වර්ෂයේදී සියයට 5.0 ක වැඩිවීම සමඟ සසඳන විට 1995 වර්ෂයේදී සියයට 8.9 ක් වැනි ඉහළ අනුපාතිකයකින් වැඩි වී ඇත. 1995 වර්ෂයේදී වූ වැඩිවීම පිළිබිඹු කරන්නේ විශේෂයෙන්ම තේ, රබර් වැනි ප්‍රධාන අපනයන මිල ගණන් සහ ආනයන මිල ගණන් හි වූ ඉහළ යාමයි. තො.ළ.මි. දර්ශකයෙහි, භාණ්ඩ අනුව වූ උප කාණ්ඩයන් වන ආහාර, විවිධ නිෂ්පාදන, රසායන හා රසායනික නිෂ්පාදන සහඉන්ධන හා ආලෝකය යන කාණ්ඩයන්, වර්ෂය තුළදී දර්ශකයේ වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු සාධක විය. සමස්ථ දර්ශකය මගින් මිල ගණන් වල වැඩිවීමේ නැඹියාවක් පෙන්නුම් කරනු ලැබුවද, පාරිභෝගික මිල දර්ශකවල දක්නට තිබූ උපනතීන්ම පෙන්නුම් කරමින්, දේශීය කාණ්ඩයේ මිල පහළ යාමක් වාර්තා කිරීම සැලකිය යුතු කරුණක් වේ.

කලින් වර්ෂයේ සියයට 1.3 ක පහත යැමට වෙනස්ව යමින් 1995 වර්ෂයේදී ආහාර උප කාණ්ඩයෙහි සියයට 5.7 ක

### සංඛ්‍යා සටහන 6.5

## තොග අලෙවි මිල දර්ශකය (1974 = 100)

| ශීර්ෂ | භරිත | දර්ශකයේ සාමාන්‍යය 1994 | දර්ශකයේ සාමාන්‍යය 1995* | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස 1994 | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස 1995 | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස දෙ.සැ. 1994 | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස දෙ.සැ. 1995 |
|---|---|---|---|---|---|---|---|
| **සියළුම ශීර්ෂ** | 100.0 | 873.4 | 950.7 | 5.0 | 8.9 | 1.8 | 17.0 |
| **භාණ්ඩ අනුව** | | | | | | | |
| ආහාර | 67.80 | 760.4 | 803.9 | -1.3 | 5.7 | -4.3 | 22.3 |
| මධ්‍යපාන | 2.86 | 969.2 | 1,101.2 | 1.4 | 13.6 | . | 16.6 |
| රෙදිපිළි හා පාවහන් | 4.02 | 482.9 | 577.2 | 6.8 | 19.5 | 4.0 | 22.7 |
| කඩදාසි නිෂ්පාදන | 1.37 | 761.6 | 948.0 | 2.2 | 24.5 | -0.1 | 45.9 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 5.16 | 550.4 | 636.3 | 1.5 | 15.6 | 3.4 | 13.3 |
| ඛනිජතෙල් නිෂ්පාදන | 6.42 | 1,295.0 | 1,314.8 | 4.4 | 1.5 | -7.7 | 8.9 |
| ලෝහ නොවන නිෂ්පාදන | 1.78 | 1,896.1 | 2112.6 | 21.0 | 11.4 | 14.3 | 9.3 |
| ලෝහ නිෂ්පාදන | 0.93 | 698.2 | 698.7 | 5.9 | 0.07 | 0.1 | 0.2 |
| ප්‍රවාහන උපකරණ | 0.80 | 682.2 | 844.6 | 3.4 | 23.8 | 5.8 | 27.4 |
| විදුලි උපකරණ හා සැපයුම් | 0.96 | 691.8 | 752.9 | 8.9 | 8.8 | 10.2 | 6.6 |
| යන්ත්‍රෝපකරණ | 1.33 | 547.0 | 580.0 | 11.0 | 6.0 | 6.3 | 4.5 |
| ඉන්ධන හා ආලෝකය | 1.79 | 1,739.3 | 2,112.2 | 33.0 | 21.4 | 44.2 | 8.6 |
| විවිධ | 4.78 | 2,050.5 | 2,446.5 | 38.5 | 19.3 | 31.3 | 2.9 |
| **ආංශික වර්ගීකරණය I** | | | | | | | |
| දේශීය ගණය | 50.31 | 833.6 | 894.6 | 13.0 | 7.3 | 8.6 | 9.0 |
| ආනයන ගණය | 27.17 | 702.0 | 775.7 | 4.5 | 10.5 | -5.8 | 24.1 |
| අපනයන ගණය | 22.52 | 1,169.1 | 1,287.3 | -5.4 | 10.1 | -3.0 | 23.0 |
| **ආංශික වර්ගීකරණය II** | | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 75.30 | 818.8 | 875.3 | 0.6 | 6.9 | -1.6 | 19.4 |
| අන්තර් භාණ්ඩ | 20.52 | 1,029.1 | 1,176.4 | 17.7 | 14.3 | 10.6 | 12.0 |
| ආයෝජන භාණ්ඩ | 4.18 | 1,094.8 | 1,205.0 | 16.7 | 10.1 | 11.5 | 7.8 |


* තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මධ්‍යස්ථ මිල වැඩිවීමක් වාර්තා විය. මේ හා සසඳන විට ආහාර කාණ්ඩය තුළ මිල ගණන් වැඩිවීමේ වේගය වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ තේ සඳහා වූ ඉහළ මිල ගණන්ය. මධ්‍යපාන, රෙදිපිළි හා පාවහන්, කඩදාසි නිෂ්පාදන, රසායන හා රසායනික නිෂ්පාදන සහ ප්‍රවාහන උපකරණ යන උප කාණ්ඩවල මිල ගණන් වර්ෂය තුලදී වේගවත්ව වැඩිවිය. පොහොර මිල සංශෝධනය කිරීම විශේෂයෙන්ම, රසායනික නිෂ්පාදන කාණ්ඩයෙහි මිල වැඩිවීමට බලපෑවේය. 1994 වර්ෂයට සාපේක්ෂව ඉන්ධන හා ආලෝකය කාණ්ඩයෙහි හා විවිධ කාණ්ඩයෙහි මිල ගණන් අඩු වේගයකින් වැඩි වුවද, 1995 වර්ෂයේදීත් පිළිවෙලින් සියයට 21.4 ක සහ සියයට 19.3 ක සැළකිය යුතු වැඩිවීම් තවදුරටත් පෙන්නුම් කරන ලදී. රබර් මිලෙහි වූ සැළකිය යුතු වර්ධනය, විවිධ කාණ්ඩයෙහි මිල වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අතර, දර සඳහා වූ ඉහළ මිල ගණන් ඉන්ධන හා ආලෝක කාණ්ඩයෙහි වැඩිවීමට හේතු විය.

ආංශික වර්ගිකරණයට අනුව දේශීය කාණ්ඩයෙහි මිල ගණන් පසුගිය වර්ෂයේදී සියයට 13 කින් වැඩිවී තිබුණු අතර, 1995 වර්ෂයේදී සාපේක්ෂව ඊට වඩා අඩු වේගයක් වූ සියයට 7.3 කින් වර්ධනය විය. පසුගිය වර්ෂය තුළ සියයට 4.5 කින් වැඩි වූ ආනයන කාණ්ඩය 1995 වර්ෂයේදී තවදුරටත් සියයට 10.5 කින් වැඩි විය. තිරිඟු ඇට මිල වැඩිවීම, ආනයන කාණ්ඩයෙහි මිල ගණන් වැඩිවීමට සැළකිය යුතු ලෙස දායක විය. 1994 වර්ෂයේදී සියයට 5.4 ක පහත වැටීමක් වාර්තා කළ අපනයන කාණ්ඩයෙහි මිල ගණන්, ප්‍රාථමික අපනයනවල මිල ගණන් වර්ධනය වීම හේතුකොට ගෙන 1995 වර්ෂයේදී සියයට 10.1 කින් වැඩි විය.

රූප සටහන 6.3
තොග අලෙවි මිල දර්ශකය
(1974 = 100)




අවසාන උපයෝජන වර්ගිකරණයට අනුව, පසුගිය වර්ෂයේ සියයට 0.6 ක ආන්තික වැඩිවීමක් පෙන් වූ පාරිභෝගික භාණ්ඩ මිල ගණන් 1995 වර්ෂයේදී සියයට 6.9 කින් වැඩිවිය.

පසුගිය වර්ෂයේදී සියයට 17.7 කින් තියුණු ලෙස ඉහළ ගිය අන්තර් භාණ්ඩ මිල ගණන්, 1995 වර්ෂයේදී තවදුරටත් සියයට 14.3 කින් වැඩිවිය. කෙසේවුවද, ආයෝජන භාණ්ඩ මිල ගණන්හි කලින් වර්ෂයේ වාර්තා වූ සියයට 16.7 ක වැඩිවීම සමඟ සසඳන විට 1995 වර්ෂයේදී එම මිල ගණන් වැඩිවී ඇත්තේ ඊට වඩා අඩු ප්‍රමාණයකින් එනම්, සියයට 10.1 කිනි.

## 6.2 වැටුප්

1995 වර්ෂය තුළ රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම වැටුප්වල කැපී පෙනෙන ඉහළ යාමක් දක්නට ලැබුණි. 1994 සහ 1995 වර්ෂවල උද්ධමන වේගය පහල මධ්‍යස්ථ මට්ටමක වූයෙන් අංශ කිහිපයකම සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ නැගුණි.

රාජ්‍ය අංශයෙහි පාසැල් ගුරුවරුන්ගේ වැටුප් සැළකිය යුතු ලෙස වැඩිවිය. මීට අමතරව තවත් සේවක කාණ්ඩ කිහිපයකම වැටුප් ද ඉහළ නැංවෙන පරිදි සංශෝධනය කෙරුණි. සංවිධානය වූ පෞද්ගලික අංශයට අයත් බොහෝ පඩිපාලක සභා එම අංශවල අවම වැටුප් වර්ෂය තුළදී සංශෝධනය කරන ලදී. සංවිධානය නොවූ අංශයට අයත්, ගොඩනැගිලි ඉදිකිරීම්, සුළු පරිමාණයේ වගා කිරීම් වැනි අංශයන්හි මූල්‍ය වැටුප්, උද්ධමන වේගයට වඩා වැඩි වේගයකින් ඉහළ ගිය බැවින් මූර්ත වැටුප් ද ඉහළ නැගුණි.

සංඛ්‍යා සටහන 6.6

### වැටුප් පරිමාණ දර්ශක අංක (1978 දෙසැම්බර් = 100)

| | මූල්‍ය | | මූර්ත | | 1995 හි ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1994 | 1995 | මූල්‍ය | මූර්ත |
| 1. රජයේ සේවකයන් | | | | | | |
| සියළුම රජයේ සේවකයන් | 735.5 | 792.5 | 115.4 | 115.4 | 7.7 | - |
| විධායක නොවන | 692.7 | 749.4 | 108.7 | 109.2 | 8.2 | 0.5 |
| සුළු සේවකයන් | 772.3 | 828.1 | 121.1 | 120.6 | 7.2 | -0.4 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 595.6 | 760.5 | 93.4 | 110.8 | 27.7 | 18.6 |
| 2. පඩිපාලක සභා | | | | | | |
| වෘත්තියන්හි කම්කරුවන් | 712.4 | 739.5 | 111.7 | 107.7 | 3.8 | -3.6 |
| සියළුම පඩිපාලක වෘත්තියන්හි කම්කරුවන් | 821.5 | 830.8 | 128.8 | 121.0 | 1.1 | -6.0 |
| කර්මාන්ත සහ වාණිජ කටයුතුවල යෙදී සිටින කම්කරුවන් | 555.8 | 647.1 | 87.2 | 94.1 | 16.4 | 7.9 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 431.4 | 456.7 | 67.6 | 66.5 | 5.9 | -1.7 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### රාජ්‍ය අංශය

ශ්‍රී ලංකා ගුරු සේවය සංස්ථාපනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දිගු කලක සිට පැවති අවශ්‍යතාවක් සපුරමින් 1995 ජනවාරි 1 වෙනිදා සිට ක්‍රියාත්මක වන පරිදි, රජයේ පාසැල් ගුරුවරුන්ගේ වැටුප් සැළකිය යුතු ලෙස සංශෝධනය කරන ලදී. මෙය 1995 වර්ෂයෙහි රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහය තුළ සිදු වූ ඉතා වැදගත් වර්ධනය සේ සැළකිය හැකිය. අදාළ වර්ෂය තුළ රාජ්‍ය අංශයේ වැටුප් වල සිදු වූ අනෙකුත් වර්ධනයන් අතර, තාක්ෂණික ශ්‍රේණියේ සහ කම්කරු පළමු පන්තිය (පළමු ශ්‍රේණිය) සහ පළමු පන්තිය (දෙවන ශ්‍රේණිය) වැටුප් පරිමාණයන් ජනවාරි සිට වැඩිවන පරිදි සංශෝධනය කිරීම ඉංජිනේරු, පශු වෛද්‍ය සහ කෘෂි කාර්මික වැනි අනෙකුත් සමාන්තර කළමනාකාරිත්ව සේවාවන්ට ප්‍රදානය කරන ලද අතුරු දීමනා දීර්ඝ කිරීම (ජූලි සිට ක්‍රියාත්මක වන පරිදි) සහ 1995 නොවැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි සුළු සේවක ශ්‍රේණිවල සහ මෝටර් රථ රියදුරන්ගේ වැටුප් සංශෝධනය හා රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහයන්හි වැටුප් විෂමතා තවදුරටත් නිවැරදි කිරීම දැක්විය හැකිය.

රජයේ පාසැල්වල ගුරුවරුන්ගේ වැටුප් සංශෝධනය කිරීම නිසා, ගුරුවරුන් සඳහා වන වැටුප් පරිමාණ දර්ශකය මගින් මනිනු ලබන, ඔවුන්ගේ මූල්‍ය වැටුප් 1995 වර්ෂයේදී සියයට 27.7 කින් ඉතා තියුණු ලෙස ඉහළ නැගුණි. මෙය කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය පදනම් කරගත් අදාළ වර්ෂයේ උද්ධමන වේගය වන, සියයට 7.7 සමඟ ගැලපීමේදී මූර්ත වැටුප් සියයට 18.6 ක තරම් ඉහළ යාමක් දක්වයි. 1994 වර්ෂයේ සියයට 8.9 කින් ඉහළ ගිය සියලුම රජයේ සේවකයන් සඳහා වූ වැටුප් පරිමාණ දර්ශකය, 1995 වසරේ සියයට 7.7 කින් ඉහළ නැගීමේ හේතුවෙන් සමස්ත මූර්ත වැටුප් නොවෙනස්ව පැවතුණි. මෙම කාණ්ඩය තුළ විධායක නොවන නිලධාරින්ගේ වැටුප් සියයට 8.2 කින් වර්ධනය වූ අතර, එය පෙර වර්ෂයේ සියයට 11.3 ක් වූ වැඩිවීම හා සැසඳීමේදී අඩු වර්ධනයක් විය. කෙසේ වුවද, විධායක නොවන නිලධාරින්ගේ මූර්ත වැටුප්, 1995 දී සියයට 0.5 කින් මඳ වශයෙන් ඉහළ නැගුණි. සුළු සේවක වැටුප් සියයට 7.2 කින් ඉහළ ගිය අතර, පෙර වසරේ වූ සියයට 6.0 ක ඉහළයාම වඩා සුළු වැඩිවීමකි. කෙසේ වුවද, මූර්ත වශයෙන් සලකන විට සුළු සේවක වැටුප් 1995 දීද තවදුරටත් පහත වැටුණි.

### පෞද්ගලික අංශය

1995 වර්ෂය තුළ, පඩිපාලක සභා මගින් ආවරණය වන සේවකයින්ගේ වැටුප් ව්‍යුහයන්හි වෙනස්වීම් කිහිපයක් සිදු විය. ක්‍රියාකාරී පඩි පාලක සභා 34 කින්, පඩිපාලක සභා 22 ක් මගින් ආවරණය වූ වෘත්තීයන්හි, අවම වැටුප් ඉහළ නැන්වුණි. මෙම සංශෝධනයේ පරමාර්ථ වූයේ අවම වැටුප් තලය මාසිකව රු. 2000/- දක්වා ගෙන ඒමයි. බීඩි කර්මාන්තය, ගොඩනැගිලි ඉදිකිරීම්, බිස්කට් සහ රසකැවිලි නිෂ්පාදනය, තොග සහ සිල්ලර වෙළඳාම, ඉංජිනේරු, බේකරි, ආරක්ෂක සේවා, උළු සහ ගඩොල් කර්මාන්තය, රබර් අපනයනය, පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය, පොල් කර්මාන්තය, රෙදිපිළි කර්මාන්තය, පවිත්‍රතා සේවා, කොහු සහ ගුදිරි කර්මාන්තය, මේස් භාණ්ඩ නිෂ්පාදනය, මෝටර් රථ ගමනාගමනය, මත්පැන් හා විනාකිරි නිෂ්පාදනය, සාත්තු නිවාස, ටයර්, ටියුබ්, රබර් ප්ලාස්ටික් නිෂ්පාදනය, හෝටල් සහ භෝජන සැපයීම සහ ලයිස් හා සිසිල්බීම නිෂ්පාදනය අවම වැටුප් සංශෝධනයන් සිදු කළ වෘත්තීන් වේ. මේ වර්ධනයන්ට අමතරව, නිෂ්පාදන ක්ෂේත්‍රයේ සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කරමින් 1994 දී 20 ක් වූ, සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 1995 දී 27 දක්වා වැඩි විය.

පඩිපාලක සභාවන්ගෙන් ආවරණය වන සේවකයින්ගේ සමස්ත අවම වැටුප් පරිමාණ දර්ශකය සියයට 3.8 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, උද්ධමනය සැලකිල්ලට ගැනීමේදී මෙය මූර්ත වැටුප් සියයට 3.6 කින් පහත වැටීමක් පිළිබිඹු කරයි. රාජ්‍ය වැවිලි අංශයේ සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව තවදුරටත් වැඩිවීම නතර කිරීමේ හේතුවෙන් සමස්ත අවම වැටුප් පරිමාණ දර්ශකය ඉහළ යාම සුළු වශයෙන් සිදු විය. කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන්ගේ වැටුප් දර්ශකය සියයට 1.1 කින් පමණක් ඉහළ නැගුණි. ඒ අනුව මෙම කාණ්ඩයේ මූර්ත වැටුප් සියයට 6.0 කින් පහත වැටුණි. කර්මාන්ත හා වාණිජ කටයුතුවල යෙදී සිටින කම්කරුවන්, 1995 සියයට 16.4 ක ඉතා ඉහළ වැටුප් වැඩිවීමක් ලබාගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මූර්ත වැටුප් සැළකිය යුතු ලෙස, සියයට 7.9 කින්, ඉහළ ගියේය. සේවා අංශයෙහි කම්කරුවන් 1995 වර්ෂයේ සියයට 5.9 ක මූල්‍ය වැටුප් වැඩිවීමක් ලබාගත් අතර, ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 1.7 කින් අඩුවිය.

### අසංවිධිත අංශය

අසංවිධිත අංශයේ දෛනික වැටුප් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල මගින් රැස්කරනු ලැබේ. මෙම වැඩපිළිවෙල මගින් උතුරු හා නැගෙනහිර පලාත් හැර දිවයින පුරා පැතිරුන මධ්‍යස්ථාන 100 කින් පමණ, වී වගාව, සුළු පරිමාණයෙන් කෙරෙන තේ , රබර් හා පොල් වගාවන්ගේ සහ සුළු පරිමාණයෙන් කෙරෙන ඉදිකිරීම් කටයුතු වල, ප්‍රධාන කාර්යයන්ට අදාල දෛනික වැටුප් එක්රැස් කිරීම කරනු ලැබේ.

1995 වර්ෂය සඳහා වූ තාවකාලික දත්තවලට අනුව, මූල්‍ය වැටුප් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ප්‍රධාන කාර්යයන් සියල්ලකම වාගේ මූර්ත වැටුප් වර්ධනය විය. ගොඩනැගිලි ඉදිකිරීම් හා සම්බන්ධ කාර්යයන්හි, වඩුවන් සහ මේසන්වරුන්ගේ දෛනික වැටුප් පිළිවෙලින් සියයට 13 කින් හා සියයට 12 කින් ඉහළ නැගුණි. වඩුවැඩ හා මේසන් වැඩ සඳහා අත් උදව්කරුවනගේ වැටුප් සියයට 10 කට වැඩියෙන් ඉහළ නැගුණි. වී වගාවේ ප්‍රධාන කාර්යයන්හි දිනක වැටුප් වර්ෂය තුළ සියයට 9 ත් 15 ත් අතර පරාසයක් තුළ ඉහළයාමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම කාර්යන්හි මූර්ත වැටුප් වාර්තාගත වර්ධනයක් පෙන්නුම් කළේය. තේ වගාවේ ප්‍රධාන කාර්යයන්හි දිනක වැටුප් සියයට 9 කින් ඉහළ නැගුණි. රබර් වගාවේ, ප්‍රධාන කාර්යයන් බොහොමයකම වැටුප් සියයට 13 කට වැඩි ප්‍රමාණයකින් වැඩි විය. පළපුරුදු කිරි කපන්නන්ගේ හිඟයක් සහ රබර් මිල ඉහළයාම පෙන්නුම් කරමින්, රබර් කිරි කැපීම සඳහා වූ වැටුප් සියයට 18 කින් ඉහළ ගියේය.